VIDUS3-2-10


SOIL MAP OF THE MAHAWELI PROJECT
SCALE 1:1,000,000 (approximately)
Jaffna
Elephant Pass
Mullaittivu
Mannar
Vavuniya
Trincomalee
Anuradhapura
Kal Oya
Puttalam
Dambulla
Batticaloa
Mahiyangana
A
C
D
E
F
G
H
I
I(H)
J
K
L
M(H)
LEGEND
1 Reddish Brown Earths & Low Humic Gley soils, undulating terrain
2 Reddish Brown Earths, Soils on Old Alluvium & Low Humic Gley soils, undulating terrain
3 Noncalcic Brown soils, Soils on Old Alluvium & Low Humic Gley soils, undulating terrain
4 Red-Yellow Latosols, flat to slightly undulating terrain
5 Alluvial soils of variable drainage & texture, flat terrain
6 Soils on Old Alluvium & Solodized Solonetz, flat terrain
7 Solodized Solonetz & Solonchaks, flat terrain
8 Grumusols, flat terrain
MISCELLANEOUS LAND UNITS
9 Rock Knob Plain and Erosional Remnants
REFERENCE
Town Anuradhapura
Proposed Reservoirs
System boundary
Existing Tanks
System name C
This soil map was compiled using data from the Soil Map of Sri Lanka (1971) and Soil Maps of the Mahaweli Project.
Compiled and drawn by :- K.S Fernando (Soil Cartographer)
August 1978
Land Use Division, Irrigation Dept., Colombo 7.

# මහවැලි යෝජනා ක්‍රම ප්‍රදේශයේ පස

## එන්. එස්. ජයවර්ධන

**බිම් පරිහරණ අංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

මහවැලි යෝජනා ක්‍රමයේ පස අධ්‍යයනය කිරීම හා ජලය සම්පාදිත වගාවන් සඳහා ඇති ආර්ථික විභවතාවය අනුව ඒවා ඇගයුම් කිරීම මෙම යෝජනා ක්‍රමය සැලසුම්කිරීම හා ක්‍රියාත්මක කරවීම සඳහා වැදගත් පූර්ව අවශ්‍යතාවයකි.

පළමුවෙන්ම මුදල් යෙදවීමේ කටයුතු ආරම්භයට පෙර යෝජනා ක්‍රමයේ ආර්ථික සම්භාව්‍යතාවය ඇගයුම් කරනු පිණිස පාංශු හා භූමි වර්ගීකරණ අධ්‍යයන පැවැත්වීම අත්‍යාවශ්‍යය.

දෙවනුව, පස වැලි හෝ ගල් සහිතවීම, නොගැඹුරුවීම, ඛාදනය වීම, අධික ලවණතාවයෙන් යුතුවීම හෝ වෙනත් අහිතකර ගුණාංග නිබීම නිසා ඵලදායී ලෙස වගා කළ නොහැකි ඉඩම් කට්ටිවල ගොවීන් පදිංචි කරවීම වැළැක්වීම පිණිස සවිස්තර පාංශු සමීක්ෂණ පැවැත්වීම අවශ්‍යය. මෙබඳු පාංශු සමීක්ෂණ වෙනුවෙන් එක් බිම් කට්ටියක් සඳහා වැයවනුයේ රු. 50 ක් පමණවූ සුළු මුදලක් වන අතර, මහවැලි යෝජනාක්‍රමයේ ජල සම්පාදිත ඉඩම් අක්කර $2\frac{1}{2}$ ක ගොවියකු පදිංචිකරවීම සඳහා රජය එක් බිම් කට්ටියක් වෙනුවෙන් වැය කරන රු. 35000 ක ආයෝජනය එමගින් සුරක්ෂිත වනු ඇත.

තෙවනුව, ප්‍රදේශයේ ජල සම්පත් ඉක්මවූ ඉඩම් ප්‍රමාණයකට මහවැලි යෝජනාක්‍රමය යටතේ ජලය සපයනු ලැබේ. එබැවින් ප්‍රශස්ත නිෂ්පාදකතාවයක් හා උපරිම ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමට නම් යෝජනා ක්‍රමයට ප්‍රදේශයේ සීමිත ජල සම්පත්වලින් ජලය සැපයීම සඳහා වඩාත් යෝග්‍ය ඉඩම් තෝරාගත යුතුය. ඒ සඳහා භූගෝලීය වශයෙන් ප්‍රදේශය තුළ පස ව්‍යාප්ත වී ඇති අයුරු අධ්‍යයනය කිරීම හා සිතියම් ගත කිරීමද භූ වර්ගීකරණ සමීක්ෂණ මගින් ජල සම්පාදිත වගා සඳහා ඇති ආර්ථික විභවතාවය අනුව මේවා වර්ගකිරීමද කළ යුතුය.

සිව්වෙනුව, වගාකළ හැකි බෝග කවරේදැයි නිශ්චය කිරීමට හා යෝජනාක්‍රමයේ විවිධ පස් වර්ග සඳහා යෝග්‍ය පාංශු--ජල පාලන ක්‍රම නිර්ණය කර ගැනීම සඳහාද පාංශු සමීක්ෂණ අවශ්‍යය. යෝජනා ක්‍රමය ඇතුලත හා පිටත සමාන පස් ඇති ගොවිපළවල් වල අස්වැන්න පිළිබඳ දත්ත උපයෝගී කරගනිමින් විශේෂ ශස්‍ය විද්‍යාත්මක කළමනාකරණ ක්‍රම යටතේ නොයෙකුත් වගාවන්ගෙන් හා පස් වර්ගවලින් බලාපොරොත්තු වියහැකි අස්වැන්න ද සොයාගත හැක. ශස්‍ය විද්‍යාත්මක, ආර්ථික, සමාජීය හා දේශපාලනමය පරාමිති ගැන සැලකිලිමත්ව කෘෂි විද්‍යාඥයන්ට හා අනිකුත් ක්‍රම සම්පාදකයන්ට මෙසේ වගාකළ හැකි බෝග අතුරෙන් විශේෂ බෝග වර්ග තෝරාගැනීම කළ හැකිය:

නවද වඩාත් කාර්යක්ෂම යෝජනා ක්‍රමයක් හා ගොවිපොළ වාරිමාර්ග ජාලයක් සැලසුම් කිරීමට හා කුඹුරුවලට ජලය සම්පාදනය කිරීමේ වැඩ සටහන නිර්මාණය කිරීම සඳහාද වාරිමාර්ග ඉංජිනේරුවන්ට හා කෘෂි විද්‍යාඥයන්ට පස පිළිබඳ අවශ්‍ය දත්තයන් පාංශු සමීක්ෂණවලින් ලබාගත හැකිය. පස අතිශයින් පාරගම්‍ය හෝ බාද්‍ය වේ නම් පෘෂ්ඨ ජල සම්පාදනය නොව නළ දිය ඉසීමේ හා නළ දිය ගැල්වීමේ වාරිමාර්ග ක්‍රම යොදගත යුතුවන අතර, මේ සඳහා සාමාන්‍යයෙන් අධික මුදලක්ද වැයකළ යුතුවේ. පසෙහි තෙතමනය රඳා පැවතීමේ ශක්තිය පසෙහි මුල් බස්නා ගැඹුර හා එක් පටයක ඒ ඒ පස් වර්ගය ව්‍යාප්තව ඇති බිම් ප්‍රමාණය යනාදී කරුණු මගින් එම පටයේ ඇල මාර්ගවල ධාරිතාවය පමණක් නොව ඵලදායී වගා සඳහා අවශ්‍ය ජලය සැපයීමේ සංඛ්‍යාතය හා ප්‍රමාණයද නිශ්චය කළ හැක. යෝජනාක්‍රම ප්‍රදේශයේ පස හා භූ ලක්ෂණවලට යෝග්‍ය ආකාරයකින් වාරිකර්මාන්ත ජාලය සැලසුම් කිරීමෙන් ජලසම්පාදන කාර්යක්ෂමතාවයද සැලකිය යුතු ලෙස වර්ධනය කරගත හැකිවේ. මේ නිසා සීමිත ජල සම්පත් වලින් නව්‍ය වශයෙන් ජල සම්පාදනය කරනු ලබන බිම් ප්‍රදේශය වැඩිකර ගත හැක.

සයවනුව, මෙම ප්‍රදේශවල අඛණ්ඩ ජල සම්පාදනය හේතු කොටගෙන එහි ස්වභාවික ද්‍රාව විද්‍යාත්මක තත්වයන් බෙහෙවින් වෙනස්වීමෙන් උද්ගත විය හැකි සම්බාධිත ජලවහනය, ලවණතාව, පාංශු ඛාදනය බඳුවූ අහිතකර ලක්ෂණ සොයාගැනීම, ඇගයුම් කිරීම හා ඒවා වැළැක්වීමට හෝ මර්දනය කිරීම සඳහා හෝ විශේෂ පාංශු විමර්ශන පැවැත්වීම අවශ්‍ය වනු ඇත. එබඳු අහිතකර පාංශු ලක්ෂණ වර්ධනයවීමට ඉඩ හැරීම, ඉපැරණි වාරිමාර්ග ව්‍යාපාර බොහොමයක් හා නූතන වාරිමාර්ග ව්‍යාපාර කිහිපයක්ද ළඟ මතින්ම අසාර්ථකවීමට හෝ ඒවායේ නිෂ්පාදකතාවය හීනවීමට මුල්වූ පොදු හේතුවකි.

පාංශු අධ්‍යයනයන්ගෙන් යෝජනාක්‍රම ඇගයුම් කිරීම හා යෝජනාක්‍රමයේ මුදල් යෙදවුම, කෘෂිකර්මය, ජල සම්පාදනය හා ගොවීන් පදිංචි කරවීමේ අවස්ථා ආදිය සඳහා ආධාරවන අන්දම මෙයින් පැහැදිලි වේ.

අමුණා ඇති සිතියමෙන් දැක්වෙන ප්‍රකාර, මහවැලි යෝජනා ක්‍රම ප්‍රදේශයේ පස, පාංශු ඒකක අටකට බෙදා වෙන්කළ හැක. සිතියම් විවරණය අනුව එක් එක් ඒකකයට අයත් ප්‍රදේශවල දක්නට ඇති පස්වල සම්බන්ධතාවය හා එම ප්‍රදේශ හා සම්බන්ධ භූමි හෝ භූ ලක්ෂණ වර්ගද දැක්වේ. මහවැලි යෝජනා ක්‍රමයේ සෑම ඒකකයකටම අයත් අක්කර ප්‍රමාණය 1 වන සංඛ්‍යා සටහනෙන් දැක්වේ. සිතියම් ඒකක 9 ලෙස දක්වා ඇති පාෂාණ සහිතවීම නිසා වගා කිරීම සඳහා ඌණ සාධ්‍යතාවයක් ඇති, ඒකක දෙකක් අවසාන ජල සම්පාදිත ප්‍රදේශයෙන් ඉවත්කරනු ලැබේ.

සී, ඩී, ඊ, එෆ්, ජී, එච්, අයි හා එල් කලාප වැඩිකොටසකට සිතියම් ඒකක 1 හි පස දක්නට ඇත. මෙම ප්‍රදේශයේ ඇති රැළි බිම්, මාරුවෙන් මාරුවට පිහිටි වැටිවලින් (1% — 8% බෑවුම සහිත) හා සමතලා පත්ල සහිත ද්‍රෝණිවලින්ද සමන්විත වේ. මෙම භූමි භාගයෙහි පස් සංයුක්ත වී ඇති අයුරු මෙසේය. (අ) රැළි බෑවුම්වල ඉහළ කොටසේ මනා ජල වහනය ඇති රතු, රතු දුඹුරු, මඳක් ගැඹුරු හා ගැඹුරු ලෝම් පසෙන් යුතුවේ. (ආ) අසම්පූර්ණ ජලවහනය ඇති බෑවුම්වල කහ හෝ කහ දුඹුරු පැහැති හා සලපසහිත තද ලෝම් පස ඇත. (ඇ) ද්‍රෝණි පත්ලෙහි දුර්වල ජලවහනය ඇති අළු හෝ අළු දුඹුරු, ගැඹුරු, මැටි සහිත හියුමික් ග්ලේ පස ඇත. මෙය අලු හෝ අලු දුඹුරු පැහැති, ගැඹුරු මැටි සහිත පසෙන් යුතුය. (අවුරුද්දේ වැඩි කොටසක වගුරු ඇති බවට ලකුණු ඇත).

මහඉලුප්පල්ලම වියළි කලාපීය පර්යේෂණ මධ්‍යස්ථානයේ හා උකුරුමැද පළාතේ ජල සම්පාදිත වාරිමාර්ග යෝජනාක්‍රම බොහොමයක දක්නට ඇත්තේද මෙම පසමය. එබැවින් අත්හද

බැලීම පදනම් මත පර්යේෂණාත්මක ගොවිපළවල් හා ගොවීන්ගේ ගොවිතැන් යටතේද මෙම පසෙහි සම්භාව්‍යතාවය ප්‍රකටය.

මෙම පස සාමාන්‍යයෙන් මිරිස්, ලූණු, රටකජු, සෝයා බෝංචි, දුම්කොළ, කව්පි, පප්පු, මුංඇට, සෝගම් වැනි වියළි කලාපීය උස්බිම් වගා සහ මනා ජලවහනය ඇති රැලි බිම්වල ඉහළ බෑවුමේ ඇති රතු දුඹුරු පසෙහි වියලි කලාපීය පලතුරු වගාවද කළ හැක. රැලි බිම්වල පහළ බෑවුමේ අසම්පූර්ණ ජලවහනය ඇති දුඹුරු පසෙහි යල මහ දෙකන්නයෙහිදීම වී වගාකිරීම කළ හැකිය. නැතහොත් මහ කන්නයේදී වී වගාකර භූගත ජලවහනය උපයෝගී කොට ගෙන යල කන්නයේදී උස්බිම් බෝග වගාකිරීමද කළ හැකිය. නිම්නවල දුර්වල ජලවහනය ඇති හියුමික් ග්ලේ පසෙහි කන්න දෙකෙහිදීම පහත්බිම් වී වගාව කළ හැකිය. උස් බෑවුම්, පෘෂ්ඨය අසල බොරළු තට්ටු, පාෂාණ උද්ගත ආදිය තිබීම නිසා මනා ජලවහනය ඇති රතු දුඹුරු පස සහිත කොටස්වල ජලසම්පාදිත වගා සඳහා යෝග්‍ය නොවන කුඩා ප්‍රදේශ සෑම සංවර්ධන කලාප යකම සවිස්තර සමීක්ෂණයන්හි මෙම පසෙහි කලාප වශයෙන් ලකුණු කරනු ලැබේ.

සිතියම් ඒකක 2 හා 3 හි ඇති මනා ජලවහනය ඇති පස සඳහා වියළි කලාපීය උස්බිම් වගාවන්ද අසම්පූර්ණ හා දුර්වල ජලවහනය ඇති පස සඳහා පහත්බිම් වී ගෙවිතැනද නිර්දේශ කර ඇත. එසේ වුවද, ඒකක 3 හි ජලවහන සම්බන්ධතා හා අදාල පස වෙනස් හෙයින් තෝරාගන්නා බෝග අනුගමනය කරනු ලබන ශස්‍ය විද්‍යාත්මක ක්‍රම, අස්වැන්න, වාරිමාර්ග සැලැස්ම, ජලසම්පාදන ක්‍රම හා සංචාරනය යනාදී කරුණු ඒ ඒ ඒකකයෙහි භෞතික හා රසායනික ගුණ ලක්ෂණ අනුව බෙහෙවින් වෙනස්වනු ඇත.

3 වන පස් ඒකකය 'බී' කලාපයේද දක්නට ඇති අතර වැව්වල කැල්සියම් රහිත දුඹුරු පස හා නිම්නවල පැරණි දියඇල්වෙහි පිහිටි පසද එහි දක්නට ඇත. මෙම පස ගල්ඔය ප්‍රදේශයේ පසට මදක් හුරුය. සාමාන්‍යයෙන් මනා ජලවහනය ඇති කැල්සියම් රහිත දුඹුරු පස, දුඹුරු හා කහ අතර වූ පැහැයෙන් යුතු වැලි ලෝම හා වැලි පසෙන්ද යුතුවේ. කැල්සියම් රහිත දුඹුරු පසෙහි රතු දුඹුරු පස සඳහා නිර්දේශිත උස්බිම් බෝග වගාකළ හැකිවුවද, ලබාගත හැකි අස්වැන්න හෝ අවශ්‍ය පාංශු හා ජල පාලන ක්‍රම පිළිබඳවද දත්ත දැනට ලබාගත නොහැක. 'බී' කලාපයේ මෙබඳු පස සංවර්ධනය සඳහා යොදාගැනීමට අදහස් කරනු ලැබේ නම් එම දත්ත ලබාගැනීම අත්‍යාවශ්‍යය. මෙම පසෙහි රළු වයනය හා එහි අඩංගු ගුණ ලක්ෂණ වල දුර්වලතාවයද හේතුකොටගෙන අස්වැන්න අඩුවීමට ඉඩ ඇති බැවින්, පොහොර හා ජලය අඩු ප්‍රමාණයක් වැඩි වාර ගණනකදී සැපයීම කළ යුතුය. ජල සම්පාදන කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම උදෙසා අතිශයින් පාරගම්‍ය වූ මෙම පසෙහි පෘෂ්ඨ ජල සම්පාදනය හෝ නළ දිය ඉසීමේ හෝ නළදිය ගැල්වීමේ ක්‍රම සඳහා පෝරු දැමූ ඇල මාර්ග උපයෝගී කරගත යුතුය. තෘණ භූමි වගාකිරීමෙන් මෙම පස පර්යනය කරගත හැකිද යන්න සොයා බැලීමද කළ යුතුය. නිම්නවල පැරණි දියඇල්වෙහි පිහිටි පස පහත් බිම් වී වගාව සඳහා යොදාගත හැක.

සිතියම් ඒකක 4 ට අයත් ජේ හා එල් කලාපවල පස් වැව්වල අධික ජලවහනය ඇති රතු ලැටසෝල් පසින් හා නිම්නවල අසම්පූර්ණ ජලවහනය ඇති කහ ලැටසෝල් පසින්ද යුතුවේ. මෙවා පහසුවෙන් කුඩුකළ හැකි ඉතා ගැඹුරු ලෝම පස වන බැවින් වියළිව පවත්නා විට වුවද පහසුවෙන් සකස්කර ගත හැක. මෙම පස්වර්ග ජල සම්පාදනය යටතේ මිරිස්, රටකජු, ලූණු, දුම්කොළ හා දොඩම් කුලයේ වගාවන්, කජු ආදියද වගාකිරීම සඳහා යොද ගත හැකිය. මෙම පසෙහි දිය කාන්දුවීම අධිකවීම නිසා නළ දිය ඉසීමේ හෝ නළ දිය ගැල්වීමේ ක්‍රම යොදගැනීම හෝ පෘෂ්ඨ ජල සම්පාදනය සඳහා පෝරු දැමූ ඇල මාර්ග යොදගැනීමද කළ යුතුය. නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම් හා කැල්සියම් අඩංගු රසායනික පොහොර බණ්ඩ පොහොර යෙදීමේ ක්‍රමයට යෙදිය යුතුයි.

ඒ කලාපයේ වැඩි කොටසක හා අනිකුත් කලාපවල මඳ වශයෙන් දක්නට ඇති දියඇලි පස, 5 වැනි සිතියම් ඒකකයෙහි අන්තර්ගත වේ. මනා ජලවහනය ඇති ගැඹුරු ලෝම දියඇලි පස ප්‍රධාන ගඟ හා ප්‍රධාන අතුගංගා ඔස්සේද හැතිර පවතී. ආරෝහ පරිවාහ ජල සම්පාදනය යටතේ කන්න දෙකෙහිදීම මිරිස්, ලූණු, රටකජු, මාංශබෝග හා දුම්කොළ වගාව සඳහා මෙය යෝග්‍යය. පසු බෑවුම්වල හා පසු වගුරු බිම්වල අසම්පූර්ණ හා දුර්වල ජලවහනය ඇති ගැඹුරු මැටි සහිත දියඇලි පස පහත්බිම් වී වගාව සඳහා යෝග්‍ය වන නමුදු, ජල ගැල්ම ඇනිවීම වැළැක්වීමට විධිවිධාන යෙදිය යුතුය.

සිතියම් ඒකක 6, 7 හා 8 අඩංගු පස සුළු ප්‍රදේශයක පමණක් දක්නට ඇති අතර, ඒවා සමතලා පථයක පැතිර පවත්නා බැවින් එහි පස අසම්පූර්ණ හා දුර්වල ජලවහන ලක්ෂණවලින් යුක්තය. එය කන්න දෙකෙහිදීම පහත්බිම් වී වගාව සඳහා යෝග්‍ය වුවද ලැබෙන අස්වැන්න හා යොදගත යුතු පාංශු හා ජල පාලන ක්‍රම ඒ ඒ පස අනුව වෙනස්වනු ඇත.

6 වන ඒකකයෙහි දක්නට ඇති ආදි දියඇලි පස සහල් සඳහා යෝග්‍ය වුවද මතුපිට තට්ටු රළුවීම නිසා අස්වැන්න අඩුවිය හැකිය. 7 වැනි ඒකකයෙහි පස මතුපිට තුනී වැලි සහිත තට්ටු හා අළු පැහැති ග්ලේ, ඇල්කලි, සට්පස් තට්ටු සහිත සොලමයින්, සොලනෙට්ස් පස්වලින්ද කහ පැහැති කැට්ති හා ලවණතාවයෙන් යුතු ලොලොන්වෙක් පසින්ද යුක්ත වේ. ලවණතාවයට ඔරොත්තු දෙන වී වර්ග වගාකළද අස්වැන්න අඩුවිය හැක. වැඩි අස්වැන්නක් ලබාගැනීමට නම් රසායනික සංශෝධන ඇතුළු දීර්ඝකාලීන ජලාපවහන හා වෙනත් සංස්කරණ ක්‍රියාමාර්ග යොදගත යුතුය. 8 වන ඒකකයෙහි ඇත්තේ අසම්පූර්ණ හා දුර්වල ජලවහනය ඇති තද අළු දුඹුරු සිට කලු දක්වා වූ පැහැයෙන් යුතු ග්‍රැමසොල් පසය. මෙහි රසායනික ගුණ බහුල වුවද භෞතික ගුණවලින් හීන වේ. මෙම පස තෙත්වූ විට ඇලෙන සුළුය. වියළි විට ඉතා තද බැවින් සෑම හෝ යන්ත්‍ර භාවිතය හෝ අසීරුය. වියළි විට ඉරිතැලීම හා තෙත්වූ විට දිය කාන්දු නොවීමද නිසා පෘෂ්ඨ ජල සම්පාදනය අසීරුය. මෙම පස ජල සම්පාදිත වගා සඳහා යොදගැනීමට නම් ඒ පිළිබඳ පර්යේෂණාත්මක හා ක්ෂේත්‍ර අධ්‍යයන පැවැත්විය යුතුය.

මෙය මහවැලි සංවර්ධන ප්‍රදේශයේ පස පිළිබඳ කෙටි විස්තර යක් පමණි. මෙම පසෙහි ගුණ ලක්ෂණ පිළිබඳ තොරතුරු ආචාර්ය කේ. ඒ. ද අල්විස් හා ආචාර්ය සී. ආර්. පානබොක්කේ සම්පාදනය කර ඇති 'Hand book of Soils of Sri Lanka' යන ග්‍රන්ථ යෙන් ලබාගත හැකිය. බිම් පරිහරණ අංශයේ කාර්යාලයෙන්ද ඒ, බී, සී, ඒඩී, ඩී හා ජී කලාපවල පාංශු සමීක්ෂණ හා පසෙහි විභව්‍යතාවය පිළිබඳ වාර්තා ලබාගත හැක.

පස අධ්‍යයන කරනු ලබන අරමුණු අනුව සංවර්ධන ප්‍රදේශ යෙන් පාංශු අධ්‍යයනයන්ගේ ප්‍රකර්ෂතාවය වෙනස්වනු ඇත. සම්භාව්‍යතාවය අගයනු පිණිස ඌණ ප්‍රකර්ෂතාවයකින් යුතු පාංශු අධ්‍යයන ප්‍රමාණවත් වුවද, සවිස්තර වාරිකර්මාන්ත සැලැස්ම හා ඉඩම් කට්ටි කිරීමේ කාර්ය සඳහා වඩාත් ප්‍රකර්ෂ වූ අධ්‍යයන අවශ්‍ය වේ.

පාංශු ශ්‍රේණි හා ඒවායේ කෘෂිකාර්මික වැදගත්කමින් යුතු අවධීන් සවිස්තර පාංශු සමීක්ෂණයන්හි සිතියම් ඒකකවල දැක්වේ. ඒකක යක් ඇතුලත සෑම ඒකකයකම ජල සම්පාදනය සඳහා මෙම ඉඩම් සංවර්ධනය කිරීම සඳහා වන වියදම, වගා වියදම හෝ ජලසම්පාදනය යටතේ අස්වැන්න යනාදිය කෙරෙහි බලපාන පාංශු හා භූමි ලක්ෂණ ඉතා පටු සීමාවක් ඇතුලත වෙනස්වන්නාවූ ආකාරයට මෙම ඒකක තෝරාගනු ලැබේ. එමනිසා, විවිධ බෝග සඳහා ඒවායේ ශස්‍ය විද්‍යාත්මක, ජලසම්පාදන හා පාංශු ජල පාලන අවශ්‍යතා සම්බන්ධයෙන් විශේෂිත කරුණු නිර්දේශ කළ හැකිය.

මෙම පාංශු සිතියම් අනුසාරයෙන් ජල සම්පාදිත වගා සඳහා ආර්ථික යෝග්‍යතාවය අනුව ඉඩම් ශ්‍රේණිගත කර ඇති ඉඩම්

වර්ගීකරණ සිතියම් සකස්කර ගත හැකිය. 'USBR' ක්‍රමය මෙබඳු ඉඩම් වර්ගීකරණ ක්‍රමයකි. මෙම ක්‍රමයෙහි 1 වන පෙළේ ඉඩම්, මෘදු බෑවුම් සහිතය. අස්වැන්න අඩුවීමට හෝ බිම සකස් කිරීමේ හා ගොවිතැන් කිරීමේ වියදම් වැඩි කිරීමට තුඩු දෙන ලක්ෂණ රහිත පාෂ්ය හා උප පාෂ්ය පසින් යුතුවේ. 2 හා 3 වන පෙළේ ඉඩම්වල මතුපිට හා පස අස්වැන්න සීමා කරන හා වගා වියදම් වැඩිකරවන සුළු ලක්ෂණවලින් සමන්විත වන බැවින් ජල සම්පාදිත ගොවිතැන සඳහා එතරම් යෝග්‍ය නොවේ. 4 වන පෙළේ ඉඩම් බොහෝ වගා සඳහා යෝග්‍ය නොවූවද, වී සහ තෘණ වැනි විශේෂ වගා සඳහා යෝග්‍යය. 5 වැනි හා 6 වැනි පෙළේ ඉඩම් ජලසම්පාදිත වගා සඳහා යෝග්‍ය නොවේ. මෙබඳු ඉඩම් වර්ගීකරණ අධ්‍යයන, ව්‍යාපාරයේ සීමිත ජලසම්පත් ආශ්‍රයෙන් ජල සම්පාදනය කළයුතු ඉඩම් තෝරාගැනීම සඳහා පදනමක් ලෙස උපයෝගී කරගත හැකිය.

ජනාවාස, පාසැල්, රෝහල් හා අනෙකුත් ප්‍රජා මධ්‍යස්ථාන හා රක්ෂිත වන ප්‍රදේශ හා වන සත්වාරක්ෂක ප්‍රදේශ, සංචාරක හා විනෝදස්වාද ප්‍රදේශ සඳහා ඉඩම් වෙන්කර ගැනීම ආදිවූ කෘෂි-කාර්මික නොවන අවශ්‍යතා සැලසුම් කිරීම සඳහාද පාංශු හා ඉඩම් වර්ගීකරණ සිතියම් අවශ්‍යය.

මහවැලි ව්‍යාපාරයේ පාංශු අධ්‍යයන එම ව්‍යාපාරය සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ අත්‍යවශ්‍ය හා අඛණ්ඩ අංශයකි. මෙරට ගොවි ජනතාව හා රටවාසීන් වෙනුවෙන් මේ සා මහත් රාජ්‍ය ආයෝජනයෙහි උපරිම ප්‍රතිලාභ ලබාගැනීමේ මූලික අරමුණ මුදුන්පත් කරගැනීම උදෙසා එබඳු අධ්‍යයන පැවැත්වීම අවශ්‍යය.

මෙම ලිපිය සකස්කිරීමෙහිලා බිම් පරිහරණ අංශයේ ප්‍රධාන ආචාර්ය කේ. ඒ. ද අල්විස් මහතාගේ ගුණදොස් දැක්වීම හා යෝජනා කෘතගුණ පූර්වකව සඳහන් කරමි. ලිපියේ අන්තර්ගත පාංශු දත්ත, ජාතික පාංශු සමීක්ෂණ වැඩසටහන හා මහවැලි යෝජනා ක්‍රම විමර්ශන වැඩ සටහන යටතේ පැවැත්වූ පාංශු සමීක්ෂණ වලින් උපුටාගන්නා ලදී.

## මහවැලි ව්‍යාපාරයේ සංවර්ධන කලාපවල පාංශු සිතියම් ඒකක බෙදී ඇති අයුරු

| සිතියම් ඒකක | පාංශු ඒකක | අක්කර ගණන X 10³ (අක්කර) | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඒ | බී | සී | ඩී | ඊ | එෆ් | ජී | එච් | අයි | අයිඑච් | ජේ | කේ | එල් | එම් | එම්එච් | මුළු ගණන |
| 1. | රතු දුඹුරු පස<br>අළු හයුමික් ග්ලේ | 28.5 | 11.0 | 123.1 | 219.2 | 57.2 | 22.7 | 21.7 | 183.0 | 255.5 | 25.5 | 54.4 | 39.4 | 171.5 | 35.7 | 30.7 | 1279.1 |
| 2. | රතු දුඹුරු පස<br>ආදි දියළු පස<br>අළු හයුමික් ග්ලේ | 7.2 | 122.5 | 17.4 | | | | | | | | | | | | | 147.1 |
| 3. | කැල්සික් රහිත දුඹුරු පස<br>ආදි දියළු පස<br>අළු හයුමික් පස | 0.5 | 76.2 | 1.0 | | | | | | | | | | | | | 77.7 |
| 4. | රතු ලැටසොල්<br>කහ ලැටසොල් | | | | | | | | | | | 22.6 | 0.7 | 12.0 | | | 35.3 |
| 5. | දියළු පස | 121.7 | 66.6 | 10.7 | 61.4 | 14.7 | | | 18.9 | 19.5 | 1.4 | 10.9 | 29.0 | 14.1 | 20.7 | 4.5 | 394.1 |
| 6. | ආදි දියළු පස<br>සොලොඩයිස් සොලනෙට්ස් | 47.8 | 41.8 | | | | | | | | | | | | | | 89.6 |
| 7. | සොලොඩයිස් සොලනෙට්ස්<br>සොලොන්චක් | 1.5 | | | | | | | | 14.6 | | 5.0 | 16.3 | | 1.3 | | 38.7 |
| 8. | ග්‍රුමසොල් | | | | | | | | | | | 19.5 | | | | | 19.5 |
| 9. | පාෂාණ ගැට සහිත නැති හා<br>බාදන ගල්ප | 3.0 | 35.6 | 26.0 | 19.1 | 21.9 | 3.0 | 7.5 | 30.3 | 19.4 | | 9.1 | 0.4 | 18.9 | 6.9 | 2.3 | 203.4 |
| 10. | වැව | 2.3 | 3.8 | 2.6 | 5.1 | | | | 11.2 | 3.1 | | 5.3 | | 2.3 | | | 35.7 |
| | මුළු ගණන | 212.5 | 357.5 | 180.8 | 304.8 | 93.8 | 25.7 | 29.2 | 243.4 | 312.1 | 26.9 | 126.8 | 85.8 | 218.8 | 64.6 | 37.5 | 2320.2 |

සටහන : අක්කර ප්‍රමාණය ගණන් ගනු ලැබුයේ සැලසුම් 4/ අහල් 1 පරිමාණයට සකස් කළ මහවැලි යෝජනාක්‍රමයේ ප්‍රාථමික පාංශු සිතියම ආශ්‍රයෙනි.